## විසර්ජන ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

### කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

I. දිළිදුකම අඩුකිරීම සඳහා වන මූලපිරීම

II. මැතිවරණ සම්බන්ධීකරණය

III. සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය කිරීම

IV. ආපදා සහන ව්‍යාපෘති හා පුනරුත්ථාපන ව්‍යාපාති පර්පාලනය

V. දිස්ත්‍රික් ව්‍යාපෘති පර්පාලනය හා මහපෙන්වීම

VI. ආදායම් එකතු කිරීම

**2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

| | |
|---|---|
| කළුතර | බණ්ඩාරගම |
| පානදුර | ඉංගිරිය |
| බේරුවල | පාලින්ද නුවර |
| දොඩන්ගොඩ | බුලත්සිංහල |
| මතුගම | මදුරාවල |
| අගලවත්ත | වලල්ලාවිට |
| මිල්ලනිය | හොරණ |

**3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම්**

**4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම**

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 14 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 499,150,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු 483,636,373 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිර් කිරීම් රු15,513,627 ක්වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 ක් විය.

| විසර්ජන ශීර්ෂය | දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 257 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. | 447,400,000 | 51,750,000 | 432,214,158 | 51,422,215 | 15,185,842 | 327,785 |

## 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය

විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා එවා තිබූ විශේෂ ප්‍රතිපාදන එකතුව රු2,300,119,990 ක් වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය/අතිරික්තය (2010 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|---|
| | | රු | රු | රු |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු හා සදාචාර අමාත්‍යාංශය | 150,000 | 150,000 | - |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 839,963,228 | 667,670,744 | 172,292,484 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 24,263,646 | 23,585,098 | 678,548 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 2,419,404 | 1,704,811 | 714,593 |
| 117 | මහාමාර්ග අමාත්‍යාංශය | 10,000 | 10,000 | - |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 10,372,239 | 7,580,188 | 2,792,051 |
| 121 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 1,096,820 | 420,553 | 676,267 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 6,907,296 | 6,556,597 | 350,699 |

| | | | | |
|---|---|---|---|---|
| 127 | කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 193,266 | 194,214 | (948) |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 10,782,001 | 8,949,734 | 1,832,267 |
| 134 | ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 29,250 | 29,170 | 80 |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 880,000 | 436,756 | 443,244 |
| 142 | ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 10,650,000 | 10,649,757 | 243 |
| 145 | නැවත පදිංචිකිරීමේ අමාත්‍යාංශය | 5,275,423 | 4,902,520 | 372,903 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 136,369,920 | 135,503,435 | 866,485 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 8,271,504 | 8,082,820 | 188,684 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශය | 100,000 | 100,000 | - |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 5,458,374 | 5,898,740 | (440,366) |
| 217 | පරිවාස සහ ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව | 4,535,795 | 4,555,025 | (19,230) |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 409,738,961 | 364,037,051 | 45,701,910 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 10,644 | 10,644 | - |

| | | | | |
|---|---|---|---|---|
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 822,642,219 | 749,661,197 | 72,981,022 |
| | | 2,300,119,990 | 2,000,689,054 | 299,430,936 |

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i.) වැය ශිර්ෂ අංක 110 හා 120 හි ප්‍රතිපාදන 25% කට වඩා ඉතිරි වී තිබුණු අතර, වැය ශර්ෂ අංක 121 හා 139 හි ප්‍රතිපාදන වලින් 50% ට වැඩි ඉතිරියක් වී තිබුණි.

(ii.) ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක. MNB & ETD/05/19/50/2010 හා 2010 පෙබරවාරි 22 දිනැති ලිපියේ . 08 වන ජේදයේ දක්වා තිබූ නියමයන්ට පටහැනිව දිස්ත්‍රික් ලෙකම් කාර්යාල පර්ශ්‍රයේ පිහිටි බුදු මැදුර ඉදිකිරීමේ අවසාන ගෙවීම හා වෙනත් ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු. 220,000 ක් හා රු. 441,041 ක් ගෙවීම් කර තිබුණි.
.

(iii) 105 - 2-3-0-2502 හා 105-2-2-6-2502 යටතේ බුලත්සිංහල සහ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලැබී තිබූ එකතුව රු. 1,409,293 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 4.3 විගණනය හා විගණන විෂය පථය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන , පොත පත් ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිලිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා ගිණුම් පොත් අනුව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ *විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශවල තත්ත්වය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.9 දක්වා ඡේදයේ ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිලියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සදහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| ශීර්ෂය/ විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 257 | විසර්ජන ගිණුම |
| 25701 | රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය |

### (ආ) අයවැය විචලනය

වැය විෂයයන් 04 ක හැර අනෙකුත් වැය විෂයයන් වල ප්‍රතිපාදන ඉතිරිය, ශුද්ධ ප්‍රතිපාදනයෙන් 17.8% සිට 46.64% දක්වා පරාසයක පැවතුණි.

### (ඇ ) පොදු තැන්පත් ගිණුම.

(i) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය කිරීමට හැකිව තිබූ රු. 54,112,612 ක් වූ තැන්පත් නියාදනය කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ii) දිරියට සවිය වැඩමුළුව ක්‍රියාත්මක කිරීමට කම්කරු දෙපාර්තමේන්තු විසින් එවා තබු රු 8,750 ක අදාල කාර්යය ඉටු නොකර පොදු තැන්පත් ගිණුමේ රදවා ගෙන තිබුණි.

### (ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 25701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය අනුව එම දින වන විට අය වියයුතු මුළු හිඟ ණය ශේෂය රු.1,123,363 ක් වූ අතර, ඉන් රු.649,199 ක මුදලක් වර්ෂ 3 ට වැඩි ඒවා වූ අතර, එම ශේෂ අය කර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි.

**4.6. වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

ගෘහ භාණ්ඩ සහිත පැරණි දිස්ත්‍රික් ලේකම් නිල නිවස සහ ඊට අදාල ඉඩම 2006 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව තිබී පුහුණු ඒකකයක් පිහිටුවීමට 2010 වර්ෂයේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මත රු. 1,159,501 ක වියදමකින් අළුත්වැඩියා සිදු කර තිබුණද 2011 සැප්තැම්බර් වනවිටත් අදාල කාර්යයට යොදා ගැනීමකින් තොරව නිෂ්ක්‍රියව පැවතුණි

**4.7. අනුකූල නොවීම්**

**(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

(අ) මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| i | මු.රෙ. . 110 | අලාභ හානි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි |
| ii | ආයතන සංග්‍රහයේ, xxiv පරිච්ඡේදයෙහි 4.6 වගන්තිය. | ණයකරු සේවයෙන් පහ කිරීම, සේවය හැර යාම, වැනි අවස්ථාවලදී විධිමත්ව එම ණය ශේෂය අයකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් පසුවද අයකර ගැනීමට නොහැකි වූ රු. 249,933 ක මුදලක් විය. |

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| 2003 අප්‍රේල් 03 දිනැති අංක 394/04 | බණ්ඩාරගම සහකාර ප්‍රාදේශීය ලේකම් වරයා විසින් 2007,2008 හා 2009 වර්ෂවල යොමුගත චක්‍රලේඛයේ දුරකථන වියදම් සීමාව ඉක්මවා රු. 66,072 ක ඇමතුම් ලබාගෙන ගෙවීම් කර තිබුණද එම මුදල් 2011 වර්ෂය වනවිටත් අයකර ගෙන නොතිබුණි. |

(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ

| | |
|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 | ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 386,961 ක ණය ශේෂය වර්ෂ 3 කට වැඩි කාලයක හිඟ හිට තිබුණද යොමුගත චක්‍රලේඛය |

ප්‍රකාර අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි

(ඇ) අමාත්‍යාංශ නියමයන්

| | |
|---|---|
| ඉඩම් වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 1993 අප්‍රේල් 08 දිනැති අංක 03/පේද/1/15 දරන ලිපිය | පොදු කාර්යයන් සඳහා රජය විසින් අත්පත් කරනු ලබන ඉඩම් වල අමාත්‍යාංශීය ගොනු අංකය, මූලික පිඹුර අංකය, ඉඩම් කැබලි අංකය, ගෙවූ වන්දි මුදල හා ගෙවූ පොලී මුදල ආදී විස්තර ඇතුළත් වාර්තාවක් සෑම මාසයක් සඳහාම ඊලඟ මාසයේ 10 දිනට පෙර යොමුගත අමාත්‍යාංශය වෙත යැවිය යුතු වුවත් එකී වාර්තාව යවා නොතිබුණි. |

(ඉ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත

| | |
|---|---|
| 1964 අංක 28 දරන සංශෝධන පනතේ අංක 32 හා 33 වගන්තිය | ඉඩම් අත්පත් කර ගැනීමේදී ගෙවිය යුතු වන්දි මුදල ගෙවිය යුතු තැනැත්තා නිගමනය කළ නොහැකි විට එකී මුදල් දිසා අධිකරණයේ නඩු අංකයක් යටතේ තැන්පත් කළයුතු වුවත් රු. 6,203,992 ක එවැනි මුදලක් දිසා අධිකරණයේ තැන්පත් නොකොට පොදු තැන්පත් ගිණුමේ කැන්පත් කර තිබුණි. |

4.8 <u>බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු.</u>

**ගැලපුම් කළයුතු ශේෂ**

2010 දෙසැම්බර් මාසය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් විසින් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයන් අනුව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ටවැඩි වර්ෂයකට අඩු චෙක්පත්වල එකත අගය රු. 1,815,759 ක් විය.

**4.9. මානව සම්පත් කළමනාකරණය**

(අ) **අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු ( ප්‍රාදේශීය ලේකම් . කාර්යාල 14 ද ඇතුලත්ව )**

2010 දෙසැම්බර් 31 දිනට ව සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 46 | 2 | |
| (ii) | තෘතික මට්ටම | 18 | 11 | 7 | |
| (iii) | ද්විතික මට්ටම | 1,289 | 1,115 | 180 | 6 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 146 | 147 | - | 1 |
| | එකතුව | 1,501 | 1,319 | 189 | 7 |

නිරීක්ෂණ:-

2010 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මානව සම්පත් තොරතුරු අනුව පරිගණක දත්ත සටහන්කරුවන් 05 දෙනෙකු , පිළිගැනීමේ නිලධාරියෙකු හා කාර්යාල කාර්ය සහයකයකු අතිරික්තව සේවයේ යොදවා තිබුණද බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිගණක දත්ත සටහන් කරුවකගේ පරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.